# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

## 8. COVID තර්ජනය මධ්‍යයේ පුද්ගලික සෞඛ්‍ය සායන ආරම්භ කිරීම

**හැඳින්වීම** - අවදානම් සහගත රෝගීන් හඳුනා ගැනීම හා අවශ්‍ය රෝගීන් වැඩිදුර ප්‍රතිකාර සඳහා යොමු කිරීමට පෞද්ගලික වෛද්‍ය සායන සහ ප්‍රාථමික ප්‍රතිකාර නැවත ආරම්භ කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවකි. මෙය ද්විතීයික හා තෘතීයික රෝහල්වල බාහිර රෝගී අංශ වෙත යාමද විධිමත් කරනු ඇත.

**සාමාන්‍ය නීති රීති**

- බටහිර වෛද්‍ය විද්‍යාවට අනුව ප්‍රතිකාර ලබා දීමට අවසර ඇත්තේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ට පමණි.
- වෛද්‍ය වෘත්තිකයින්ට තමන්ව COVID රෝගයෙන් ආරක්ෂා වීමට මෙන්ම රෝගීන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඔවුන්ගේ හැසිරීම වෙනස් කළ හැකි ආකාරය පිළිබඳ නවතම උපදෙස් සහ මාර්ගෝපදේශ ලබා දෙනු ඇති ලැබේ.
- නිරෝධායන පනත යටතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරා ඇති බලතල අනුව නීති විරෝධී ලෙස බටහිර වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නොමැති අයට දඬුවම් කරනු ලැබේ.
- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ඇතුල්වීම් දොරටුව ආසන්නයේ ප්‍රදර්ශනය කළ යුතුය.
- "කොවිඩ් ලෙස සැකකරන" රෝගීන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව ළඟම ඇති COVID කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.
- පෝලිම් අවම කිරීම සඳහා දුරකථනය හරහා වෙලාව වෙන්කරගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය (ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා (EMR) උපදේශන කාලය අඩු කරයි.) වීඩියෝ හරහා රෝගීන්ට උපදෙස් දීම දිරිමත් කරනු ලැබේ.
- කාල වේලා වෙන් කිරීමේදී, එක් එක් සැසිවාරයේ ආරම්භයේදීම නිදන්ගත රෝග ඇති රෝගීන්ට කාලය ලබා දෙන්න.
- හමුවීමට නියමිත වේලාවට පැමිණීමට රෝගීන් උපදෙස් දෙන්න. එක් එක් උපදේශනය සඳහා වෙන් කළ කාලය පවත්වා ගැනීමට හැකි සෑම විටම උත්සහ කරන්න.
- රෝගීන්ට ප්‍රතිකාර කිරීම අතරතුර වෛද්‍යවරයා විසින් මුහුණු ආවරණයක් පැළඳිය යුතුය. එක් එක් රෝගියා දැකීමෙන් පරීක්ෂා කිරීමෙන් පසු අත් සේදීම හෝ ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කරකයකින් සේදීම කල යුතුය.
- COVID රෝගය වැළඳීමේ වැඩි අවදානම් ක්‍රියා පටිපාටිවලදී වෛද්‍යවරයා මුහුණු ආවරණ සහ සම්පූර්ණ ආවරණ සහිත ඇස් ආවරණ / ඇස් කණ්ණාඩි පැළඳිය යුතුය. සහායකයින්ද ඒ හා සමාන ආරක්ෂක උපකරණ පැළඳිය යුතුය.
- සෑම ආයතනයකටම නිවැරදිව පිරිසිදු කිරීම, විෂබීජ නාශක හා කසල බැහැර කිරීමේ ක්‍රම තිබිය යුතුය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකඟතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතු අතර පිටපතක් තමන් සතුව තබා ගත යුතුය.

**පෞද්ගලික වෛද්‍ය සායන සඳහා සහභාගී වන රෝගීන්**

- සියලුම රෝගීන් සහ ඔවුන් සමග සහභාගී වන්නන් මුහුණු ආවරණ පැළඳිය යුතුය.
- රෝගීන් මීටරයක් දුරින් අසුන් ගත යුතුය.
- අත් සේදීම හෝ ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කරක රෝගීන් සඳහා ලබා ගත යුතුය.
- රෝගියා රෝගීන් පරීක්ශා කරන කාමරයට ඇතුළු වීමට පෙර COVID රෝගී ලක්ෂණ පෙන්නුම් කරනවාදැයි අදාළ ප්‍රශ්න ඇසීමෙන් පරීක්ෂා කළ යුතුය (කාලය වෙන් කර ගැනීමට දුරකතනයෙන් අමතන අවස්තාවේදී හෝ ඉන් පසුව දුරකථනය හරහා විමසීම වඩාත් සුදුසු වේ).




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.